# අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (ඕ.එම්.පී) සඳහා සාමාජිකයන් පත්කිරීම

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ (සංශෝධිත පරිදි) විධිවිධාන ප්‍රකාරව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ (ඕ.එම්.පී) සාමාජික ධුරයන්ගේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා;

- සිද්ධිමය කරුණු සෙවීම හෝ විමර්ශනය සිදු කිරීම,
- මානව හිමිකම් නීතිය,
- ජාත්‍යන්තර මානුෂීය නීතිය,
- මානව ප්‍රතිචාර පිළිබඳ පූර්ව පළපුරුද්දක් සහිත හෝ
- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ (ඕ.එම්.පී) කර්තව්‍ය ඉටු කිරීමට අදාල වෙනත් සුදුසුකම් සහිත

තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර, පාර්ලිමේන්තු වෙබ් අඩවියෙහි (www.parliament.lk) *ඕ.එම්.පී සඳහා සාමාජිකයන් පත්කිරීම* නමැති ක්ෂණික සබැඳි යටතේ පළකර ඇති ආකෘතිය අනුව පිළියෙල කළ යුතු අතර, යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2024 දෙසැම්බර් මස 09 දින හෝ එදිනට පෙර,**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**

යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ/ විද්‍යුත් ලිපියෙහි විෂය වශයෙන් 'ඕ.එම්.පී සඳහා සාමාජිකයන් පත්කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදි.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**
**2024.11.24**